00126

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2019**

**ESD1135/EPD3335-** පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික ඉගැන්වීම සඳහා සමෝධානික ප්‍රවේශය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.03.03 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

## 1 <u>වන කොටස</u>

01. පෙර පාසල් අධ්‍යාපනය තුළ සමෝධානිත ප්‍රවේශයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

02. සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රම සහ සමෝධානිත ප්‍රවේශය අතර වෙනස්කම් සඳහන් කරන්න.

03. සමෝධානිත ඉගෙනුම් -ඉගැන්වීමේ ක්‍රියාවලියේ සුවිශේෂ ලක්ෂණ තුනක් (03) ලියන්න.

04. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා තේමා පාදක ප්‍රවේශයේ ඇති වාසි මොනවා ද?

05. ප්‍රාථමික පාසල් සිසුන්ගේ දක්නට ලැබෙන සුවිශේෂ හැකියාවන් හතරක් (04) සඳහන් කරන්න.

06. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේදී ප්‍රාථමික ගුරුවරයකු ඉටුකළ යුතු වගකීම් හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "ඇගයීම" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

08. "කාර්ය සාධන ගොනුව" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පෙරපාසල් දරුවන් සඳහා තේමාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක මොනවා ද? (ලකුණු 10)

(ii) පෙරපාසල් දරුවන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරතවීමේ දී දැකිය හැකි ලක්ෂණ හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) 1972 ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් සිදුවූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) 1972 සහ 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දක්නට ලැබෙන සමානතා සහ අසමානතා මොනවා ද? උචිත උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. ශ්‍රී ලංකාවේ පෙරපාසල් ගුරුවරුන් සඳහා ගුරු පුහුණු වැඩසටහන් අත්‍යවශ්‍ය වේ.

(i) ඉහත වගන්තිය සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක් ද? (ලකුණු 06)

(ii) දින දෙකක පෙර පාසල් ගුරු පුහුණු වැඩමුළුවක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 08)

(iii) පෙරපාසල් ගුරුවරුන් සඳහා ගුරු පුහුණු වැඩසටහන් මගින් ළඟා කර ගත හැකි වාසි මොනවා ද? (ලකුණු 06)

12. (i) සමෝධානිත ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථාවක් සැලසුම් කිරීමේ දී පෙරපාසල් ගුරුවරයකු ක්‍රියා කළයුත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සුදුසු තේමාවක් තෝරාගෙන පෙරපාසල් දරුවන් සඳහා සමෝධානිත ප්‍රවේශය යොදා ගනිමින් පාඩම් සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 10)

13.(i) තක්සේරුකිරීම යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 06)

(ii) තක්සේරු කිරීමේ වාසි මොනවා ද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) තක්සේරු කිරීම ප්‍රාථමික ගුරුවරුනට වාසිදායක වන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.